# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2350/46 - 2023 සැප්තැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2023.09.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KSWD&EIP/ACQ/DWC/07.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/4/2020/LRB/180.

කොළොන්නාව වැසිජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොහිලවත්ත ඩොනල්ඩ් පෙරේරා මාවතට යාබදව පිහිටි තුප්පහිවෙල කුඹුර නමැති වගුරු ඉඩම් කොටසේ ජල තටාකයක් සකස් කිරීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම් රජයට පවරාගෙන ඇති බව 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*රජයට පවරා ගන්නා ලද ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 506C, මහබුත්ගමුව B, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහබුත්ගමුව B ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 521822 හා 2023.09.08 දිනැති කැඩැස්තර සිතියමේ 04 වන කලාපයේ හා පත්‍ර අංක 01 හි දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.1414 ක් වූ පහත විස්තර කර ඇති ඉඩම් කැබලි හතර (4) :

**1. කැබලි අංක 01**

ඉඩමේ නම: තුප්පහිවෙල කුඹුර; ඉඩමේ පරිහරණය: වගුරු බිම, ඇළ සහ ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: දොන් සුරන්ජිත් රණසිංහ විජේගුණවර්ධන, දොන් පුෂ්පකුමාර රණසිංහ විජේගුණවර්ධන, දෝන දයානි දීපිකා රණසිංහ විජේගුණවර්ධන, දෝන සන්ධ්‍යාණී රණසිංහ විජේගුණවර්ධන, දොන් ජගත් පාලිත කුමාර රණසිංහ විජේගුණවර්ධන, දෝන චන්ද්‍රිකා රණසිංහ විජේගුණවර්ධන බුලත්සිංහලගේ රංජනී කුරේ, බුලත්සිංහලගේ කාන්ති කුරේ, බුලත්සිංහලගේ නන්ද ප්‍රියශාන්ත කුරේ, බුලත්සිංහලගේ ගාමිණී කුරේ, බුලත්සිංහලගේ චූලනී කුරේ, දෝන කුසුමා රණසිංහ විජේගුණවර්ධන, මොරගොඩගේ කුසුමාවතී පින්තු, මොරගොඩගේ ප්‍රේමසිරි පින්තු (මියගොස්), මොරගොඩගේ අරියසීලි පින්තු, මොරගොඩගේ චන්ද්‍රදාස පින්තු, මොරගොඩගේ කල්‍යාණවතී පින්තු, රණමුබ හේවගේ නිර්මලා චාන්දනී, රණමුබ


1A - G 40372 – 35 (2023/09)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

හේවගේ මාටින් ප්‍රනාන්දු, කළුආරච්චිලාගේ දෝන නිලාංජනී විජේරත්න සහ තවත් අය; ප්‍රමාණය: හෙක්ටයාර් 2.9806 වේ.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: තුප්පහිවෙල කුඹුර; ඉඩමේ පරිහරණය: ඇළ; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0353.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: තුප්පහිවෙල කුඹුර, වරිපනම් අංක 080/006 කොටසක් මහබුත්ගමුව; ඉඩමේ පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අබ්දුල් සමාද් මොහොමඩ් පච්සුල් හීලාම්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0380.

04. **කැබලි අංක 04**
ඉඩමේ නම: තුප්පහිවෙල කුඹුර, වරිපනම් අංක 080/006 කොටසක් මහබුත්ගමුව; ඉඩමේ පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අබ්දුල් සමාද් මොහොමඩ් පච්සුල් හීලාම්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0875.

ඉහත සඳහන් ඉඩම් කැබලි සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිල්ලකින් බලය පැවරූ අයවලුන් 2023 ඔක්තෝබර් මස 18 දින පෙ.ව. 9.30 ට රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පිහිටා ඇති ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023.10.11 දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් අත්කර ගැනීම සඳහා වන්දි මුදල් ඉල්ලා සිටීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් පිටපත් 02 ක් සහිත වූ ලියවිල්ලකින් මා වෙත දැනුම් දිය යුතුය.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කොළොන්නාව වැසි ජලාපවහන හා
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය,
කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2023 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළොන්නාව වැසි ජලාපවහන හා
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය,
ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 09-200

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: EP/LD/9/2/24.
ඉ. අ. අංකය: 03J/41/D/21.

පහත සඳහන් විස්තර කර ඇති ඉඩම මහජන කටයුත්තක් සඳහා රජයට අත්කර ගැනීමට අදහස් කර තිබේ. වැඩි විස්තර සඳහා අංක 1531/ 10 දරන 2008.01.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* බලන්න.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 1 පළාත | - | දකුණ |
| 2. දිස්ත්‍රික්කය | - | ගාල්ල |
| 3. ප්‍රා. ලේ. කොට්ඨාසය | - | ඇල්පිටිය |
| 4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය | - | 26 බී ඉගලතලාව |
| 5. ගමේ නම | - | ඉගල |
| 6. පිඹුරු අංක | - | මූ.පි.ග. 2981 |
| 7.කැබලි අංක | - | කැබලි අංක 1 සිට 5 දක්වා |
| 8. ප්‍රමාණය | - | හෙක්ටයාර් 2.023 |

**චතුරංග ගුණසේකර,**
ප්‍රාදේශීය ලේකම්,
ඇල්පිටිය.

2023 සැප්තැම්බර් මස 13 වැනි දින,
ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09-0201

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.